**ශීර්ෂය 274 - අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**---------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 විගණන මතය**

**-----------------**

අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2018 දෙසැම්බර් 31 දිනට අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**--------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණන කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගනණ සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

  මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂයන් සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූලා‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, මූලා‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූලා‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

ලේඛන හා පොත්පත් පවත්වා නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය<br>2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | පිළිතුරු සපයා නොමැත. |
| (ආ) ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය<br>මුදල් රෙගුලාසි 451 ප්‍රකාර චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | දැනට ලේඛන යාවත්කාලීන කරමින් පවතී. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් සලසා දුන් ප්‍රතිපාදන උපයෝජනය
---------------------------------------------------------------------------------------

අමාත්‍යාංශ 26 ක්, දෙපාර්තමේන්තු 19 ක් හා කාර්යාල 01 ක් විසින් විවිධ කාර්යයන් සඳහා පිළිවෙලින් රු.මිලියන 4,300 ක්, රු.මිලියන 244 ක් හා රු.මිලියන 115 ලෙස එකතුව රු.මිලියන 4,659 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 4,209 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 450 ක් හෙවත් සියයට 9.6 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අධිකරණ අමාත්‍යාංශය විසින් ලබාදී තිබූ රු.121,817,000 ක් උපයෝජනය කර නොතිබුණි. | වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලින් ලැබෙන ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කොට වර්ෂය තුළ ඉටු කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතුයි. | 2018 වර්ෂයේ අවසාන මාසයේ පැවති අක්මුදල් ඌනතාවය මත මෙම ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කිරීම නොහැකි වී ඇත. ඒ අනුව මෙම ප්‍රතිපාදන ඉතිරිවීම සිදු වී ඇති අතර, අතැති බිල්පත් ලෙස 2019 වර්ෂයේ මෙම ගෙවීම් සිදු කර ඇත |
| (ආ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් විසින් සපයා තිබූ ප්‍රතිපාදන වලින් සියයට 50 කට වඩා අඩුවෙන් උපයෝජනය කර තිබුණි. | වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලින් ලැබෙන ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කොට වර්ෂය තුළ ඉටු කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතුයි. | 2018 වර්ෂයේ අවසාන මාසයේ පැවති අක්මුදල් ඌනතාවය මත මෙම ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කිරීම නොහැකි වී ඇත. ඒ අනුව මෙම ප්‍රතිපාදන ඉතිරිවීම සිදු වී ඇති අතර, අතැති බිල්පත් ලෙස 2019 වර්ෂයේ මෙම ගෙවීම් සිදු කර ඇත. |
| (ඇ) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් සලසා තිබූ රු.4,360,900 ක මූලධන ප්‍රතිපාදන වලින් රු.4,036,611 ක් ඉතිරි කර තිබුණි | වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වලින් ලැබෙන ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කොට වර්ෂය තුළ ඉටු කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සැකසිය යුතුයි. | 2018 වර්ෂයේ අවසාන මාසයේ පැවති අක්මුදල් ඌනතාවය මත මෙම ප්‍රතිපාදන පූර්ණ ලෙස උපයෝජනය කිරීම නොහැකි වී ඇත. අතැති බිල්පත් ලෙස 2019 වර්ෂයේ මෙම ගෙවීම් සිදු කර ඇත. |

2.2 අත්තිකාරම් ගිණුම් ශේෂ

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවල එකතුව රු.මිලියන 1.97 ක් වූ අතර, එම ණය ශේෂය තුළ වූ වර්ෂ 5 කට වඩා වැඩි කාලයක් අය නොවී පවතින ණය ශේෂය රු.මිලියන 1.5 ක් වී තිබුණි. | අදාළ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුයි. | එක් එක් ණය ශේෂයන් අයකර ගැනීමට විවිධ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ආ) පළාත් සභා ආයතන වෙත ස්ථානමාරු වී තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.60,418 ක ණය ශේෂය වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණද, එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුයි. | අදහස් දක්වා නැත. |
| (ඇ) සේවය අතහැර ගොස් තිබූ නිලධාරියෙකුගේ නොපිය වූ රු.61,335 ක ණය ශේෂය 2018 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක කාලයක් ඉක්මවා තිබුණද, අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | අදාළ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතුයි. | අදහස් දක්වා නැත. |

2.3 ගණන් දීමේ නිලධාරීන් විසින් සිදු කළයුතු සහතික වීම්.

------------------------------------------------------------

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික වියයුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබියයුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුව ඇත. | අදහස් දැක්වීම් කර නොමැත |

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

-------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | -------------------------- | ---------- | -------------------- | -------------- | -------------- |
| | | රු. | | | |
| (අ) | මුදල් රෙගුලාසි 165.2 (අ) | 538,200 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක එකතුව අවස්ථා 48 කදී තැපැල් කාර්යාල මගින් නොගෙවා ආපසු එවා තිබූ එකතුව රු.538,200 ක් වූ වැඩිහිටි දීමනා මුදල් ඇණවුම්, මුදල් ඇණවුම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 165.2(අ) ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | විමසුමෙහි සඳහන් රු.306,400 කට අදාළ මුදල් පිළිබඳ ඇණවුම් ලේඛනයේ සඳහන් කර නොතිබුණු අතර, දැන් එය සටහන් කිරීම ආරම්භ කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 316 | | හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් පොතක වටිනාකම රු.20,000 ක් වූ ගැබිනි මව්වරුන්ට දෙනු ලබන මුද්දර පොත් 61 ක් ලේඛනගත කර සුරක්ෂිත ලෙස සේප්පුවක බහා තබා නොනිබුණි. | මුදල් රෙගුලාසි 316 ප්‍රකාරව කටයුතු කළ යුතුයි. | පෝෂණ දීමනා මුද්දර පොත් අගුළු සහිත අල්මාරියක් තුල ආරක්ෂිතව තැබිමටත් අවශ්‍ය අවස්ථාවල දී පමණක් අල්මාරියෙන් ලබා ගැනීමටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇත |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 21 හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 මැයි 29 දින අංක PFP/PMD GEN/003 දරන ලිපිය | | ඇස්තමේන්තුව රු.5,401,935 ක් වූ හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියතිත්තවැව අලුත් ගම්මාන ජල ව්‍යාපෘතියේ ඇස්තමේන්තුව කොටස් 3 කට වෙන් කර ප්‍රජා සංවිධාන වෙත ඇස්තමේන්තු ගත අගයන්ට පවරා තිබුණි. | තරඟකාරී මිල ගණන් යටතේ අදාළ ඉදිකිරීම් සිදු කිරීම සඳහා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ PEP/PMD/GEN/003 චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතුයි. | එකඟ වෙමි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4.2. (අ) ඡේදය අනුව මෙම කොන්ත්‍රාත්තුව මෙසේ කොටස් 03කට බෙදා ඇත. |
| (ඈ) | සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශ ලේකම්ගේ 2016 | | හෙරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නොගෙවූ වැඩිහිටි දීමනා ලේඛනයක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළයුතුයි. | එකඟ වෙමි .අදාල මුදල් ඇණවුම් විෂයභාර නිළධාරිණිය විසින් පොදු 118 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ජනවාරි 12 දිනැති 1/2016 චක්‍රලේඛය | | | | ආකෘතියෙහි සටහන් කර සරප් වෙත භාරදීම සිදු කිරීමට කටයුතු කර ඇත. |
| (ඉ) | දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016/05 දරන චක්‍රලේඛය | 2,955,000 | සමාජ ආරක්ෂණ ප්‍රතිලාභීන්ගේ මරණයකදී අවමංගල්‍යය කටයුතු අවසන් වීමට පෙර ප්‍රතිලාභ ගෙවිය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 ක ප්‍රතිලාභීන් 197 ක් සඳහා ප්‍රතිලාභ ගෙවීමේදී සැලකිය යුතු කාල ප්‍රමාදයක් ගෙන තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළයුතුයි. | අනු/දිලේ/2/16/1/52 හා 2019.03.07 දිනැති ලිපියෙන් අප්‍රමාදීව අදාල මරණ ප්‍රතිලාභී මුදල් ලබා දිය යුතු බවට සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කර ඇත. |
| (ඊ) | දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2016/03 හා 2017/06 දරන චක්‍රලේඛය | | ගලෙන්බිඳුනුවැව, මිහින්තලේ හා පලාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල දිවි නැගුම සිප්දොර ශිෂ්‍යත්ව අරමුදල් අප්‍රමාදව ගෙවිය යුතු වුවද, මාස 01 සිට අවුරුදු 2 දක්වා ප්‍රමාද වී ගෙවා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළයුතුයි. | විවිධ කරුණු මත එම නිර්දේශයන්ගේ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් නියමිත ලෙස ගෙවීම කිරීම ප්‍රමාද විය. නමුත් වර්තමානය වන විට නිවැරදි කර ඇත. |

2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු.

-----------------------------------------

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දිස්ත්‍රික් විමධ්‍යගත ප්‍රතිපාදන යටතේ ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩඩියන්කුලම ශ්‍රී මිහිඳු දහම් පාසලට ලැප්ටොප් පරිගණක ලබාදීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.205,000 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි. මේ යටතේ ලබාගන්නා ලද රු.199,500 ක් වටිනා ලැප්ටොප් පරිගණක 3 ක් ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබූ ගරු මන්ත්‍රීවරයාගේ කාර්යාලයේ නිලධාරීන් සහ අදාළ දහම් පාසලේ ප්‍රධාන ආචාර්යවරිය දුස්සන්ධානගත වී එම ලැප්ටොප් පරිගණක පෞද්ගලික පරිහරණය සඳහා යොදවාගෙන තිබුණි. | විමධ්‍යගත අයවැය ප්‍රතිපාදන වලින් සිදු කරන ලද ව්‍යාපෘති වල අපේක්ෂිත අරමුණු ඉටුවන සේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේදය ශක්තිමත් කළ යුතුයි. | මේ වන විට ලැප්ටොප් පරිගණක 03 ප්‍රධානාචාර්ය විමලාවතී මහත්මිය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී ඇති අතර, පරිගණක දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතී. එහෙත් වගකීම් කාලය තුළදී කිසියම් කාර්මික දෝෂයකට ලක් වන්නේ නම් නැවත අළුත්වැඩියාව සඳහා වන වියදම ශ්‍රී මිහිඳු දහම් පාසලේ ප්‍රධානාචාර්ය විමලාවතී මහත්මිය වෙතින් අයකර ගන්නා බවට ප්‍රාදේශීය ලේකම් විසින් ඇයව දැනුවත් කර ඇත |

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ව්‍යාපෘති

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආපදා අවම කිරීමට දායක වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සලසා තිබූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 11.26 න් ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ 03 ක ආපදා හානි අවදානම් හෝ ආපදාවකට ලක් නොවූ සාමාන්‍ය මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වැය කර තිබුණි. | ආපදා අවම කිරීම සඳහා ලද ප්‍රතිපාදන, ආපදා හානි සිදුවන ප්‍රදේශවල ඊට අදාළ ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුතුයි. | මෙම සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමට ප්‍රථම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අදාල කොට්ඨාශවල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මුලිකත්වයෙන් වසම්භාර ග්‍රාම නිලධාරින් හා සංවර්ධන නිලධාරින් හමුවේ පැවැති සාකච්ජා වලදී එම යෝජනා අදාල වසම්වලද යන්න පිළිබඳව සොයා බැලූ අතර, එහිදී එම නිලධාරින්ගේද නිරික්ෂණයන් සහිතව ක්ෂේත්‍රයේ නිරික්ෂණයක් ද සිදුකර ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන ලදී. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (outcome) ලබානොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දියතිත්තවැව අලුත් ගම්මානයේ ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,039,947 ක වටිනාකමකට ළිඳක් ඉදිකර තිබුණි. එම ඉදිකර තිබූ ළිඳෙහි ජලය පානයට සුදුසු ප්‍රමිතියෙන් නොවූයෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | ව්‍යාපෘති අරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතියේ ඵලදායිතාවය ඇගයීමට ලක් කර ක්‍රියාත්මක කළහැකි ව්‍යාපෘති පමණක් ක්‍රියාවට නැංවිය යුතුයි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු පිළිගත හැක. |
| (ආ) අනුරාධපුර මහජන පොළ පරිශ්‍රයේ මාළු කඩකාමර සංකීර්ණය ඉදි කිරීම සඳහා 2015 සහ 2016 වර්ෂ වලදී රු.මිලියන 6.35 ක වියදමක් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු | ව්‍යාපෘති අරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතියේ ඵලදායිතාවය ඇගයීමට ලක් කර ක්‍රියාත්මක කළහැකි ව්‍යාපෘති පමණක් | මෙම මාළු වෙළඳසැල ලෙස යෝජිත කඩ කාමර 16 අනුරාධපුර මහනගර සභාවේ යෝජනාවක් අනුව ඉදි කිරීම ආරම්භ කළ අතර, අනුරාධපුර |

| | | |
|---|---|---|
| ලැබේ.<br>• මෙම ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.<br>• අපේක්ෂිත සැලසුම්වලට හා ඉංජිනේරු ප්‍රමිතීන්ට අදාළ වී නොතිබුණි.<br>• මහජන පොළ ප්‍රජාවගේ අවශ්‍යතාවයන්ට අනුකූල වී නොතිබුණි.<br>• මෙම කඩ කාමර සංකීර්ණය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන මුළුමනින්ම කඩා ඉවත් කර තිබුණි. | ක්‍රියාවට නැංවිය යුතුයි. | නාගරික කොමසාරිස්ගේ 2016.01.07 දරණ ලිපියෙන් ලිපිය අනුව 2017 වර්ෂයේදී මීට පෙර ඉදිකරන ලද කඩකාමර මාළු කඩ ලෙස පරිවර්තනය කිරීමට නියමිත බව මා වෙත දන්වා ඇත. |

3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම.

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------- | ------------- | ---------------------- |
| (අ) 2017 ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන විශේෂ වැඩසටහන යටතේ අනුමත ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 187 තුලානේ මුරියාකඩවල පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.1,500,000 ක් වෙන් කර තිබූ නමුත්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි | විදුලිබල මණ්ඩලය සමඟ සාකච්ඡා කොට කඩිනමින් පහසුකම් ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයට පත් කළයුතුයි. | මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 187 මුරියාකඩවල තුලානේ ජල ව්‍යාපෘතිය ඉදි කිරීමට යෝජිත ස්ථානයට විදුලිය නොමැති වීම හේතුවෙන් අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත |
| (ආ) ගල්නෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවුකන දුම්රියපල අසල උද්‍යානය ඉදිකිරීම සඳහා රු.85,395 ක් වියදම් දරා තිබූ නමුත්, දුම්රිය රක්ෂිතයේ ඉදිකිරීම් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් තහනම් කිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඉදිකිරීම් සිදු කිරීමට ඇති හැකියාව හඳුනාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. | මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී අවශ්‍ය අනුමැතිය දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා දීමට ප්‍රමාද වීම හේතුවෙන් වර්ෂය අවසානයේදී නිම කර ගැනීමට නොහැකි වී ඇත. එම නිසා මේ වන විට 2019 වර්ෂය සඳහා අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇත. |

3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 වර්ෂයට පෙර අඩක් නිමකර තිබූ තඹුත්තේගම සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා 2017 වර්ෂය තුළ රු.6,690,758 කට ඉදිකිරීම් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. ගිවිසුමට අදාළ ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයයන් 17 ක් සම්පූර්ණයෙන්ම අතහැර තවත් වැඩ විෂයයන් 15 ක් සියයට 50 කට අඩු මට්ටමකට නිමකර ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. එසේ වුවද, 2018 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතයට ගත හැකි තත්ත්වයට ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 සහ 4.3.2 ප්‍රකාරව ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ප්‍රතිපාදන ලබාගෙන නිශ්චිත කාල වකවානුවක් තුළ නිම කිරීමට සැලසුම් කළයුතුය. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේදී තාක්ෂණික අවශ්‍යතාවය මත මෙම වෙනස් වීම් සිදුකරන ලද අතර, 2018 වර්ෂයේ වෙන් කළ ප්‍රතිපාදන අනුව 2018 වර්ෂයේ ඉදිකිරීම් නිම කරන ලදි. වැඩ අවසන් කිරීම සඳහා මේ වන විට ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කරමින් පවතී. 2019 වර්ෂයේ වැඩ සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) ගලෙන්බිඳුනුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අශ්වයාබැඳිවැව පානීය ජල ව්‍යාපෘතියේ ජල ටැංකිය ඉදිකිරීමට සහ ජලනල එලීමට එකතුව රු.18,774,614 ක වියදමක් දරා තිබුණි. 2018 දෙසැම්බර් 31 දින වන විටත් මෙමගින් පානීය ජල සැපයුම් අවශ්‍යතාව ඉටු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 සහ 4.3.2 ප්‍රකාරව ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර ඒ සඳහා අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ප්‍රතිපාදන ලබාගෙන නිශ්චිත කාල වකවානුවක් තුළ නිම කිරීමට සැලසුම් කළයුතුය. | අශ්වයාබැඳිවැව ජල ව්‍යාපෘතිය සම්බන්ධව අභ්‍යන්තර විගණන ඒකකය විසින් පරීක්ෂණයක් පවත්වන අතර, 2019 වර්ෂය තුළ රු.මි.2.99ක මුදලක් ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇත. මේ වන විට ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් අදාල ව්‍යාපෘතියේ අඩුපාඩු සකස් කර 2019 අගෝස්තු මාසය වන විට ප්‍රතිලාභින් වෙත ජලය ලබා දීමට නියමිතව පවතී |

3.5 මුදල් නිදහස් කර තිබූ නමුත්, ප්‍රගතිය ලබා නොගත් ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) උතුරු මැද පළාතේ නියං කාලගුණික තත්ත්වය බලපා ඇති ප්‍රදේශවල සිදී ඇති වගා ළිං යථා තත්ත්වයට පත් කිරීමට ස්ථාපිත කළයුතු පානීය ළිං ඉදිකිරීම සඳහා අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙත රුපියල් මිලියන 50 ක් ලබාදී තිබූ නමුත්, ඒවා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිසංස්කරණය කළයුතු ළිං 1860 ක ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 39.3 ක ප්‍රතිපාදන නිදහස් කර තිබූ නමුත්, පැවති අධික නියං තත්ත්වය අවසන් වී වර්ෂාපතනය ලැබීමට පෙර විධිමත් පරිදි සැලසුම් සකස් කර අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රුපියල් මිලියන 11.5 ක් වියදම් දරා වගා ළිං 560 ක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණි. | ප්‍රදේශයේ වර්ෂාපතන තත්ත්වය පෙර වර්ෂවල අත්දැකීම් සමඟ හඳුනාගෙන නියමිත කාලයක් තුළ අවසන් කිරීමට සැලසුම් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුයි. | මෙම ප්‍රතිපාදන මුදල් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් වෙන් කර තිබුණේ 2018.09.11 දිනැති ලිපිය මගිනි. ඒ සමගම එම ප්‍රතිපාදන අදාල ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිදහස් කළ ද ඔක්තෝම්බර්, නොවැම්බර් මාස වල පැවති වැසි තත්ත්වය නිසා මෙම ළිං ඉදි කිරීම සඳහා වෙන් කළ මුදල් 100%ක් උපයෝජනය කිරීමට නොහැකි විය. තවද වැසි සමය ආරම්භ වීමත් සමග ජල අවශ්‍යතාවය සම්පූර්ණ වීම, මෙම මුදල් වැය නොකිරීමට තවත් හේතුවක් විය. |
| (ආ) මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 10 දෙනෙකු වෙත රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා රු.100,000 ගෙවීම් කර තිබූ නමුත්, එම ප්‍රතිලාභීන් නියමිත පුහුණුව ලබා රියදුරු බලපත්‍ර ලබා නොතිබීම නොතිබුණි. | රැකියා විරහිත ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනාගැනීම සිදුකර ප්‍රතිලාභී නාම ලේඛනය අනුමත කළයුතුයි. | අවස්ථා 02කදී පුහුණුලාභීන් 09 දෙනා බැගින් නම්කර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත යොමු කළ ද ඔවුන් ඒ සඳහා විධිමත් පරිදි සහභාගී නොවුන නිසා, නැවත තෙවන වතාවට ද ප්‍රතිලාභීන් 09 දෙනෙකු පුහුණුව සඳහා ඉදිරිපත් කරන ලදි. මේ වන විට ඔවුන්ගේ පුහුණුවීම් ආරම්භ කර ඇත. |

3.6 ප්‍රසම්පාදනයන්.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධන වැඩසටහන මගින් අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ කෘෂි උපකරණ බෙදාදීම යටතේ | ප්‍රසම්පාදන ලියකියවිලි දක්වා ඇති පිරිවිතර අනුව සැසඳුම් සිදු කිරීමට එකඟ වූ ලංසුකරුවන් | ඉදිරිපත් කර තිබූ තාක්ෂණික වාර්තාවේ FMRC සහතිකය සහ අදාල සැපයුම්කාර ආයතනය විසින් |

| | | |
|---|---|---|
| රු.4,361,800 ක් වටිනා විදුලි මෝටර් 243 ක් ප්‍රසම්පාදන ලියකියවිලිවල සඳහන් පිරිවිතර අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ලෙස මිලදී ගෙන තිබුණි. | විසින් ඔවුන් එකඟ වූ පිරිවිතර අනුව සැපයුම් ලබාගෙන ඒවා මුදල් රෙගුලාසි 237(අ) ප්‍රකාරව ලබාගත යුතු සහතික ලබාගෙන ගෙවීම් කළයුතුයි. | ඉදිරිපත් කරන ලද තොරතුරු පදනම් කරගෙන සකස් කරන ලද අතර, අපේක්ෂා කළ පිරිවිතරයන් ඒ අනුව සනාථ කර ගත් බැවින්, අදාල සමාගමට ගෙවීම් සිදු කරන ලදි. එසේ වුවද මුදල් ගෙවීමේදී 5%ක රඳවුම් මුදලක් ලබා ගත් අතර, මෙම මුදල මෙතෙක් නිදහස් කර නැත |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා දේශන ශාලා පුටු 80 ක් අපේක්ෂිත පිරිවිතර වලට අනුකූලව අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ලංසුකරුගෙන් මිලදී නොගෙනීම නිසා රු.225,182 ක අලාභයක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළයුතුය. | පිරිවිතර වලට ගැළපෙන හා රජ භාවිතයට සුදුසු වන පරිදි මිල ගණන් ඉදිරිපත් කරන ලද දේශන ශාලා පුටු මිලට ගැනිම සිදු කර ඇත. |

3.7 වත්කම් කළමනාකරණය
----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දිස්ත්‍රික් ලේකම් සතු රජයේ නිවාස 15 ක් වසර 10 කට අධික කාලයක සිට උතුරු මැද පළාත් සභාවේ නිලධාරීන්ගේ පරිහරණය සඳහා ලබාදී තිබුණි. එම නිවාස වලින් ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 05 ඡේදය ප්‍රකාරව කුලී අය කිරීම දිස්ත්‍රික් ලේකම් විසින් සිදුකර නොතිබුණි. එම නිවාස වල පදිංචි කාලය වසර 5 සීමාව ඉක්මවූ පසු සන්තකය ආපසු භාර ගැනීම සඳහා වූ අභ්‍යන්තර පාලනය දිස්ත්‍රික් ලේකම් විසින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම නිවාසවල පාලනය දිස්ත්‍රික් ලේකම්ගෙන් බැහැර වී තිබුණි. කෙසේ වෙතත්, මෙම නිවාස වෙනුවෙන් වරිපනම් බදු ගෙවීම දිස්ත්‍රික් ලේකම් විසින් අඛණ්ඩව සිදුකර තිබුණි. | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කුලී අය කිරීම හා දිස්ත්‍රික් ලේකම් සමඟ නිවාස ලාභියා එළඹි ගිවිසුම ප්‍රකාරව සන්තකය ආපසු භාර ගත යුතුයි. | අදහස් දක්වා නැත |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහන 05 ක ලියාපදිංචි සහිතක වල මුල් පිටපත් කාර්යාලය සතුව නොපැවතුණි. | එක් එක් වාහනයට අයත් ලියාපදිංචි සහතික වල මුල් පිටපත් ලබාගෙන භාරයේ තබාගත යුතුයි. | පිළිතුරු සපයා නැත |

| | | |
|---|---|---|
| (ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා කල්බදු ක්‍රමය යටතේ ලබාගත් වාහන 9 ක කල්බදු කාලසීමාව අවසන් වී ඇතත්, අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත මාරු කරගෙන නොතිබුණි. | කල්බදු වාරික ගෙවීම අවසන් වූ වහාම ලියාපදිංචි අයිතිය දිස්ත්‍රික් ලේකම් නමින් ලබාගත යුතුයි. | පිළිතුරු සපයා නැත |

3.8 කළමනාකරණ දුර්වලතා
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) හොරොව්පොතාන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත 2010 වර්ෂය තුළ ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් තවදුරටත් රු.210,872 ක් අයකරගෙන පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය පියවා නොතිබුණි. | 2010 වර්ෂයේ සිට හිඟව පවතින මෙම අත්තිකාරම් කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගතයුතුයි. | හොරොව්පොතාන විවිධ සේවා සමූපකාර සමිතිය ඈවර කිරීම සඳහා මේ වන විට කටයුතු කර ඇති බැවින්, මෙම නොපියවූ අත්තිකාරම් මුදල, ඈවර කර ලැබෙන මුදලින් ප්‍රමුඛත්වය දී නිරවුල් කරන බවට උතුරුමැද පළාත් සමූකාර සංවර්ධන කොමසාරිස් මා වෙත දන්වා ඇත. |
| (ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති ගිනි අවි ගබඩාවේ පහත සඳහන් පාලන දුර්වලතාවයන් පැවතුණි. | | |
| (i) දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ඇති ගිනි අවි ගබඩාවේ භාරගත් දිනය, ලද කාරණය හා ගිනි අවි අංකය ඇතුළු තොරතුරු ලේඛනගත නොකරන ලද පැරණි ගිනි අවි 388 ක් පැවතුණි. | ලැබීම් නිකුත් කිරීම් හා පිටත පවතින ගිනි අවි පිළිබඳ හඳුනාගැනීමට හැකිවන පරිදි ලේඛනයක් නඩත්තු කළයුතුයි. | ගිනි අවි ගබඩාවේ තොරතුරු ලේඛනයක් පෙර තිබී නොමැති අතර, 2012.10.23 දිනෙන් පසුව තොරතුරු ලේඛනගත කර ඇත. ඉදිරි මාස 03 තුළ ලේඛනගත නොවූ, සුරක්ෂිතාගාරයේ ඇති ගිනි අවි තොරතුරු ලේඛනගත කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. |
| (ii) පවත්වා තිබූ ලේඛනය අනුව 2012 වර්ෂයෙන් පසුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට භාරගත් ගිනි අවි වලින් ගිනි අවි 203 ක ශේෂයක් 2019 ජනවාරි 30 විගණිත දිනට පැවතිය යුතු වුවද, එදිනට ගබඩාවේ ඇති ගිනි අවි වලින් හඳුනාගත හැකිව තිබුණේ ගිනි අවි 167 ක් පමණි. ඒ් අනුව ගිනි අවි 36 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. | ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු කළයුතුයි. | 2012.10.23 දිනෙන් පසුව රජයට භාර ගන්නා ලද ගිනි අවි පිළිබඳ තොරතුරු ලේඛනයට අනුව භාරගත් ගිනි අවි ප්‍රමාණයේ 191ක් ලෙස සඳහන් වී ඇති අතර, එයින් භාවිතයට සුදුසු ගිනි අවි 30ක් විකුණන ලද බව ලේඛනයෙහි සඳහන් වී ඇති අතර, ගිනි අවි 03ක් පිළිබඳ තොරතුරු දෙවරක් බැගින් සඳහන් වී ඇත. |
| (iii) ගබඩාවේ තිබූ පිස්තෝල 15 ක් සහ පතරොම් 500 කට ආසන්න සංඛ්‍යාවක් කුමන කාර්යයක් වෙනුවෙන් ගබඩා කර තිබේද යන්න හඳුනාගත නොහැකි විය. | ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු කළයුතුයි. | පිස්තෝල 15ක් යුධ සමයේදී ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කර එම පිස්තෝල ආපසු භාරගත් ඒවා වේ යැයි සැළකිය හැක. තවද පතොරම් 500ක් ද එම වකවානුවේදී |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රාදේශීය ලේකම්වරුන් භාර දී ඇති බව අනුමාන කළ හැක. |
| (iv) | අංක MOD/CTS/12/FA/14 හා 2018 සැප්තැම්බර් 11 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය ප්‍රකාරව දිස්ත්‍රික්කය තුළ නිකුත් කළ ගිනි අවි 241 ක් සඳහා වාර්ෂිකව බලපත්‍ර අලුත් කර නොතිබුණි. | ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි කටයුතු කළයුතුයි. | 2019 වර්ෂයේ බලපත්‍ර අලුත් කිරිමේදී දඩ මුදල් අයකිරිමට කටයුතු කළ අතර, 2016 වර්ෂයේ සිට මේ දක්වා අලුත් නොකරන ලද බලපත්‍රලාභීන් දැනුවත් කර 2019 වර්ෂයේ බලපත්‍ර අලුත් කිරිමේදි දඩ මුදල් අය කිරිමට ඉදිරි මාස 3 තුළ කටයුතු කරමි. |
| (ඇ) | මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී පහත සඳහන් කොන්ත්‍රාත් පරිපාලන දුර්වලතා නිරීක්ෂණය විය. | | |
| (i) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා අදියර 4 ක් යටතේ පිරිවැය රු.මිලියන 47.84 ක් වැය වූ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල 2018 මැයි 30 දින වන විට ඉදිකිරීම් අවසන් කර තිබුණි. ගොඩනැගිල්ල සඳහා විදුලිබලය ලබාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වර්ෂයකට ආසන්න කාලයක් ගත වී ඇතත්, එය මහජන අයිතියට පැවරීමට නොහැකි වී තිබුණි. | ඉදිකිරීම් අවසන් කළ ව්‍යාපෘති හැකි ඉක්මණින් භාවිතයට ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙල ක් සැකසිය යුතුයි. | ගොඩනැගිල්ල සඳහා තෙකලා විදුලි සැපයුම් සබඳතාවයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී අදාල ගොඩනැගිල්ලේ පමණක් නොව, භූමියේ ඇති සියලුම ගොඩනැගිලි සඳහා වරලත් විදුලි ඉංජිනේරු සහතිකයක් ලබා ගැනීමට සිදු වීම මත පැරණි ගොඩනැගිල්ලේද විදුලි පරිපථ නවීකරණය කිරීමට සිදු වූ අතර, මේ වන විට එම සියලු කටයුතු සම්පූර්ණ කර 2019.05.14 දින නව ගොඩනැගිල්ල සඳහා විදුලි සැපයුම ලබා දී ඇත |
| (ii) | 4 වන අදියරේ ඉදිකිරීම්වල ගොඩනැගිල්ල ඇතුළත බෙදා වෙන්කිරීම් (Partition) ඇස්තමේන්තුවේ නිශ්චිතව දක්වා ඇති අමුද්‍රව්‍ය වෙනුවට එම කොටස් සඳහා වෙළඳපොලේ සියයට 50 ක් පමණ මිල අඩු වෙනත් අමුද්‍රව්‍යයක් භාවිත කර ඉදිකිරීම් සිදුකර තිබුණි. එසේ වුවද, ගෙවීම් කිරීමේදී භාවිත කළයුතු හා භාවිතා කර තිබූ අමුද්‍රව්‍ය වල මිල විශ්ලේෂණයක් සිදු නොකර සිදුකර කර ඇති වෙනස්කම් නොසලකා රු.3,525,113 ක් වූ ඇස්තමේන්තු මුදල සම්පූර්ණයෙන්ම කොන්ත්‍රාත්කරුට ගෙවීම් කර තිබුණි. | තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව අනුමත කළ පිරිවිතර ප්‍රකාරව ඉදිකිරීම් සිදු කර ඇති බවට ව්‍යාපෘති භාර ඉංජිනේරු විසින් සහතික විය යුතුයි. ඊට වෙනස් පිරිවිතර පදනම් කරගෙන ගෙවීම් කිරීමේදී මිල ගණන්වල සාධාරණත්වය ඉංජිනේරු විසින් සහතික කළ යුතුයි. | ප්‍රමාණවත් පිළිතුරක් සපයා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තිරප්පනේ, පලුගස්වැව, හොරොව්පොතාන හා මිහින්තලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක රජයේ ඉඩම්වල පදිංචි වී සිටින හා වගා කරන ගොවීන් වෙත ලබාදීම සඳහා ජනාධිපතිවරයා විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත එවා තිබූ දීමනා පත්‍ර 536 ක් ලැබී දීර්ඝ කාලයක් තිස්සේ අදාළ ප්‍රතිලාභීන් වෙත නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගරු ජනාධිපතිවරයා අත්සන් කර එවනු ලබන දීමනා පත්‍ර වහාම හිමිකරුවන්ට ලැබීමට සැලැස්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුයි. | නොබෙදා තිබූ දීමනා පත්‍ර අතුරින් දීමනාපත්‍ර ලාභීන් හා උරුමක්කරුවන් වෙත කිහිපයක් ලබා දී ඇති අතර, ඉතිරි දීමනාපත්‍ර සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාල ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇත. |
| (ඉ) | මැදවච්චිය පැරණි උප දිසාපති කාර්යාලය පිහිටි ඉඩම බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් දීර්ඝ කාලයක් තිස්සේ පදිංචි වී සිටින අතර, ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ අනුව එම ඉඩමෙන් පර්චස් 40 ක් දීර්ඝ කාලීන බදු පදනම මත පදිංචිකරුට පවරා දීමට ඉඩම් කොමසාරිස් නිර්දේශ කර තිබුණි. එසේ වුවද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉඩමේ ඉතිරි කොටස නිදහස් කර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ පරිදි කටයුතු කර පරර්චස් 40 ක් සඳහා දීර්ඝකාලීන බලපත්‍ර ලබාදී ඉතිරි ඉඩම් කොටස නිදහස් කර ගැනීමට කටයුතු කළයුතුයි. | නීත්‍යානුකූලව ඉඩම අදාල පදිංචිකරු වෙත ලබා දීම සඳහා කිහිප අවස්ථාවක්ම දැනුම් දීම් සිදු කළ ද අවශ්‍ය අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් මෙම කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති අතර, 2019.04.30 දින පැවති ඉඩම් සමීක්ෂණය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගෙන ඇත |
| (ඊ) | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් ක්‍රියාත්මක කළ ණය යෝජනා ක්‍රමය<br>---------------------------------<br>දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ණය යෝජනා ක්‍රම 6 ක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා මූලික අරමුදල ලෙස රු.19,661,100 ක් ලබාදී තිබුණි. එම ණය අයකර ගැනීම පිළිබඳ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර ණය යෝජනා ක්‍රමවලින් ලබාදී තිබූ ණය මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට අපේක්ෂා ණය රු.10,528,860 ක්, චක්‍රීය ණය රු.1,351,927 ක් සහ වැන්දඹු හා ගෘහමූලික කාන්තාවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘති ණය රු.491,366 ක් වශයෙන් එකතුව රු.12,372,154 ක් හිඟව පැවතුණි. | හිඟ ණය අයකිරීම සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් සකස් කළයුතුයි. | මේ පිළිබඳව පසුගිය විගණන හා කළමනාකරණ කමිටුවේදී ද සාකච්ඡා කළ අතර ඉදිරි මාස 03 ඇතුළත මේ පිළිබඳව සම්පූර්ණ පරීක්ෂාවක් කර වාර්තාවන් සකස් කරනු ලැබේ |
| (ii) | පශු සම්පත් ණය, ධීවර ණය හා විදේශගත වීමට අපේක්ෂිත කාන්තාවන්ගේ විකල්ප ආදායම් උත්පාදන ණය වැඩසටහන සඳහා | ණය වැඩ සටහන් පිළිබඳව පසුවිපරම් කිරීමට හැකි වන සේ | මෙම වාර්තා විධිමත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගන්නා බව දන්වා සිටිමි |

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය තුළ කොපමණ ණය මුදලක් නිකුත් කර ඇද්ද යන්න හා ණය හා පොලී අයවීමේ ප්‍රගතිය ඇතුළත් තොරතුරු කිසිවක් දිස්ත්‍රික් වනිතා කටයුතු සංවර්ධන නිලධාරී භාරයේ නොතිබුණි. | විධිමත් ලෙස වාර්තා තබාගත යුතුයි. | |

4. තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

---------------------------

| නිරීක්ෂණය<br>------------- | නිර්දේශය<br>------------- | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළයුතුව පැවතුණු අතර, සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාල තම ක්‍රියාකාරී සැලැස්මෙහි ඊට අදාල ක්‍රියාකාරකම් ඇතුළත් කර තිබූ බවට හා වාර්ෂික අයවැය ලේඛනයෙහි ප්‍රමානවත් ප්‍රතිපාදන සලසාගෙන තිබූ බවට හඳුනාගත නොහැකි විය. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතින්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' ප්‍රකාරව කටයුතු කළයුතුය. | දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

5. යහපාලනය

-------------

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

------------------------------------

| නිරීක්ෂණය<br>------------- | නිර්දේශය<br>------------- | ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ හා සන්නද්ධ සේවා වල නිලධාරීන්ගේ මරණයකදී ඔවුන්ගේ පවුල්වල බාලවයස්කරුවන් වෙනුවෙන් සිදු කරනු ලබන තැන්පතු අදාළ බාලවයස් කරුවන්ගේ වයස සම්පූර්ණ වී තිබියදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක තැන්පත්කරුවන් 07 දෙනකුගේ ගිණුම් පොත් අයිතිකරුවන්ට නිදහස් කර නොතිබුණි. | නිසි පරිදි ලේඛන නඩත්තු කර කල්පිරීම් හඳුනාගෙන අදාළ ප්‍රතිලාභීන් වෙත නිදහස් කිරීමට කටයුතු කළයුතුයි. | වර්තමානය වන විට බාල වයස්කාර ගිණුම් හිමියන්ගේ වයස සම්පූර්ණ වන විටම අදාල ගිණුම් පොත් භාරදිම සඳහා අවශ්‍ය පියවර ගැනීම පහසුව පිණිස ලේඛනයක් සකස් කර ඇත. |